# බුදුරජාණන් වහන්සේට හා භික්ෂූන්ට කුඩ පූදා අනුසස් අටක් ලැබ නිවනින් සැනසෙන්න

## පිළින්දිවච්ඡ ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 565 - 567)

හංසවතී නගරයේ ජීවත් වූ දොරටුපාලයෙක් පදුමුත්තර බුදු රජාණන් වහන්සේට සහ රහතන් වහන්සේලා ලක්ෂයකට කුඩ පූජා කළා. එයින් ඔහුට ආනිසංස අටක් ලැබුණා.

- ශීතල හා උෂ්ණය දැනුනේ නැහැ.
- දැලි කුණු තැවරුනේ නැහැ.
- විපත් උවදුරු ඇති වුනේ නැහැ.
- උපදින සෑම ආත්මයේ දී ම වැඳුම් පිදුම් ලබන කෙනෙක් වුණා.
- සියුම් වූ සමක් ලැබුණා.
- හැමවිට ම පිරිසිදු සිතක් ලැබුණා.
- අවසන් භවය හැර අන් භවයන්හි අලංකාර කුඩ ලක්ෂයක් හිසෙහි දැරුවා.
- අප බුදු රජුන්ගේ කාලයේ පැවිදි ව නිවනින් සැනසුණා.